# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ **2006** මාර්තු මස **31** වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2006 මාර්තු මස 31 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

**මිල :** රු. 5.50 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

# 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2006 මාර්තු මස 31 වන දින]

එල්.ඩී.—ඕ. 15/2006.

## මුදල් නීති පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 2006 අංක 9 දරන මුදල් නීති (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ V වන පරිච්ඡේදයේ VII කොටසේ ඇති ශීර්ෂය වෙනුවට පහත දැක්වෙන ශීර්ෂය ආදේශ කිරීමෙන් එම පනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 422 වන අධිකාරයේ VII කොටසේ ශීර්ෂය සංශෝධනය කිරීම.

"VII වන කොටස

බැංකු ආයතන වල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ණය මෙහෙයුම් පිළිබඳ අතිරේක නියෝග."

3. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයේ VII වන කොටසේ, 99 වන වගන්තියට පෙරාතුවම පහත දැක්වෙන වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එකී ප්‍රඥප්තියේ 98ආ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය :— ප්‍රධාන ප්‍රඥප්තියේ 98ආ අළුත් වගන්තිය ඇතුළත් කිරීම.

"VII කොටස සඳහා අර්ථ නිරූපනය. 98ආ. මේ පනතේ මේ කොටසේ කාර්ය සඳහා "බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නට 1988 අංක 30 දරන බැංකු පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තියේ "වාණිජ බැංකු" යන වචන වෙනුවට "වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 100 වන වගන්තිය සංශෝධනය කිරීම.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 101 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියෙහි—

(අ) එහි (අ) ඡේදයේ "වාණිජ බැංකු" යන වචන වෙනුවට "වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන වචන ආදේශ කිරීමෙන් ;

(ආ) එහි (ආ) ඡේදයෙහි අවසානයට ඇති "නියම කරනු ලැබිය හැකිය :" යන වචන වෙනුවට "නියම කරනු ලැබිය හැකිය ; හෝ" යන වචන ආදේශ කිරීමෙන් ;

(ඇ) එම වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ආදේශ කිරීමෙන් :—

"(ඇ) වාණිජ බැංකු හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවලින් ආර්ථිකයේ හඳුනාගත් යම් කොටස්වලට ලබා දෙන ණය ප්‍රමාණයේ අවම ප්‍රතිශතය නියම කළ හැකි ය :"; සහ

(ඇ) එහි අතුරු විධානයේ "යම් වාණිජ බැංකුවකට" යන වචන වෙනුවට "යම් වාණිජ බැංකුවකට හෝ යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (2) වන උපවගන්තියෙහි "එක් එක් වාණිජ බැංකුවේ" යන වචන වෙනුවට "එක් එක් වාණිජ බැංකුවේ සහ එක් එක් බලපත්‍රලාභී විශේෂිත බැංකුවේ" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 102 වන වගන්තිය සංශෝධනය කිරීම.

**6**. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 102 වන වගන්තියෙහි "වාණිජ බැංකුවල ප්‍රාග්ධනය සහ අතිරික්තය" යන වචන වෙනුවට "වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රාග්ධනය සහ අතිරික්තය" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7**. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එම වගන්තියෙහි (1) උපවගන්තියෙහි (අ) සහ (ආ) ඡේදවල "වාණිජ බැංකු විසින්" යන වචන වෙනුවට "වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(2) එම වගන්තියේ (3) වන උපවගන්තියේ "වාණිජ බැංකු විසින්" යන වචන වෙනුවට "වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්" යන වචන ආදේශ කිරීමෙන්.

**8**. ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තියෙහි "බැංකු ආයතන විසින්" සහ "එම ආයතන විසින්" යන වචන වෙනුවට පිළිවෙලින් "බැංකු ආයතන සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 105 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.